**වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව**

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

**2021 වර්ෂයේ / 45 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව - කෙටුම්පතකි.**

**2021.11.11**

**පැමිණීම**

1 ගරු සභාපති කේ.වි. සුසන්ත පෙරේරා මහතා
2 ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා
3 ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා
4 ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5 ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6 ගරු මන්ත්‍රී යු. ජුඩ් එම්මානුවෙල් මහතා
7 ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8 ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
9 ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දිමස් ප්‍රනාන්දු මහතා
10 ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා
11 ගරු මන්ත්‍රිනි ජී. ලීනා ප්‍රියන්ගිකා පෙරේරා මහත්මිය
12 ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය
13 ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
14 ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රමාලතා මහත්මිය
15 ගරු මන්ත්‍රී එල්. දිනේෂ් චන්දන පෙරේරා මහතා
16 ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ප්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා
17 ගරු මන්ත්‍රී ආර්.පී. අකිල ශිරංග රාජපක්ෂ මහතා
18 ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා
19 ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා
20 ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
21 ගරු මන්ත්‍රී එච්.ඒ. ක්ලීටස් පෝල් පෙරේරා මහතා
22 ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා
23 ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
24 ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා

25 ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
26 ගරු මන්ත්‍රී බී. ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා
27 ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
28 ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය
29 ගරු මන්ත්‍රිනි එම්. මේරි වාලට් කුරේරා මහත්මිය
30 ගරු මන්ත්‍රිනි ආර්.පී. නදීකා රණවීර මහත්මිය
31 ගරු මන්ත්‍රී වී.ඒ. වර්ණරංග ගුණසේකර මහතා
32 ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා
33 ගරු මන්ත්‍රිනි ඒ.එම්. චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
34 ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා
35 ගරු මන්ත්‍රී අයි.බී. සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
36 ගරු මන්ත්‍රී එස්.එම්. දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## <u>**01.2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සහ 2021.11.01 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**</u>

❖ 2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 13 වන පිටුවේ තීරණ අංක 05 යටතේ මන්ත්‍රී දීමනාවෙන් කොටසක් දංකොටුව රෝහලේ කොවිඩ්-19 අරමුදලට බැර කිරීම සම්බන්ධයෙන් සඳහන් වී තිබෙන බවත්, එම සාකච්ඡාවේදී ගරු මන්ත්‍රී මණ්ඩලයම එයට කැමති වූයේදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා විමසා සිටින ලදී.

එහිදී කැමති නම් යම් පරිත්‍යාගයක් සිදු කරන ලෙසට තමන් පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම තීරණයේ එලෙස සඳහන් නොවන බවත්, එය නැවත කියවා බලන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

වාර්තාව සකස් කිරීමේදී එලෙස දෝශයක් සිදු වී ඇති බවත් නැතිනම් එහිදි අදහස් වූයේ කැමැත්ත මත යම් පරිත්‍යාගයක් සිදු කරන ලෙසටයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 13 වන පිටුවේ තීරණ අංක 05 පහත පරිදි සංශෝධනය විය.

| |
|---|
| තීරණ අංක 05<br><br>දංකොටුව රෝහලේ කොවිඩ්-19 ආසාදිතයින් සඳහා වාට්ටු දෙකක් හා කාමර 12කින් යුත් ගොඩනැඟිල්ල අළුත්වැඩියා කිරීමට යම් ආධාර මුදලක් ඊළඟ මහා සභා වාරයේදී ගරු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත පරිදි දීමනාවෙන් පරිත්‍යාග කරමුයැයිද , එම මුදල දංකොටුව රෝහලේ වෛද්‍යතුමාගේ අතටම ගරු මහා සභාවේදී ලබා දෙමු යැයිද ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.** |

❖ 2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 19 වන පිටුවේ ආදහනාගාරය නොමිලයේ ලබා දීම සම්බන්ධයෙන් වූ සාකච්ඡාවේදී තමන් අදහස් මතු කරමින් ඉදිරිපත් කල කොටස වාර්තාවේ සඳහන් වී නොමැති බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. නැවත වතාවක් හඬ පටය පරීක්ෂා කර බලන ලෙසටද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ සම්බන්ධයෙන් තීරණයක් නොගත් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් තමන් කතා කල කොටස මෙම වාර්තාවට ඇතුළත් වී නොමැති බවත්, හඬ පටයද තමාට ඇසීමට හැකි නම් හොඳ බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

❖ 2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 14 වන පිටුවේ තීරණ අංක 07 හි ස්ථිර තැන්පතුවක ආයෝජනය කිරීම ලෙස සඳහන් කිරීමේදී රාජ්‍ය බැංකුවක යනුවෙන් සඳහන් විය යුතු බවත් එය සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 14 වන පිටුවේ තීරණ අංක 07 පහත පරිදි සංශෝධනය විය.

තීරණ අංක 07

සභා අරමුදලින් එදිනෙදා අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරික්තයක් ඇතැයි සභාවේ සභාපති විසින් අදහස් කරන අවස්ථා වලදී ඒ පිළිබඳව සලකා පහසුවෙන් මුදා හැරිය හැකි මුදල් ප්‍රමාණයක් රාජ්‍ය බැංකුවක ස්ථිර තැන්පතුවක ආයෝජනය කිරීම හා අවශ්‍ය විටක එම මුදල් ආපසු මුදා ගැනීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ බලතලයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

- 2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ 19 වන පිටුවේ ආදහනාගාරය නොමිලයේ ලබා දීම සම්බන්ධයෙන් ඊළඟ මහා සභාවේදී සාකච්ඡා කරමුයැයි සඳහන් වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අද දින සාකච්ඡා කරමුයැයි ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 01**

**2021.10.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සහ 2021.11.01 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභා වාර්තාව සම්බන්ධයෙන් කතා කිරීමට දෙයක් තිබෙන බවත්, සභාව මඟින් අතුරු ව්‍යවස්ථාවක් සෑදූ බවත් එහිදී එක් කොටසක් සංශෝධනයක් කිරීමට යෝජනා කරන බවත් ප්‍රකාශ කරන ලදී. 02 වන පිටුවේ පාලක මණ්ඩල සංයුතිය ලෙස තිබෙන කොටසේ සංයුතිය සෑදී ඇති අකාරය තිබෙන බවත්, එහිදී ක්‍රීඩා කමිටුව මඟින් ස්ථාවරව නම් කරන එහි සාමාජිකයින් ලෙස සඳහන් වී ඇති බවත්, මෙහිදී කමිටුවම ඇතුලත් කරන ලෙසද ප්‍රකාශ කරන ලදී. නම් කරන සාමාජිකයින් ගණනද සඳහන් කර නොමැති බවත්, එහිදී කාරක සභා සාමාජිකයින් සියළු දෙනාවම පත් කලේ නම් පක්ෂ විපක්ෂ දෙපක්ෂයම ඇතුළත් වන බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් යොදා සකස් කර ගත් විට අතුරු ව්‍යවස්ථාව අනුව කිසිඳු විපක්ෂ මන්ත්‍රීවරයෙකුට කිසිඳු ආකාරයකින් සම්බන්ධ වීමට නොහැකි වන බවද ක්‍රීඩා කමිටුවම ඇතුළත් කලේ නම් විපක්ෂයේ නියෝජනයක්ද එහි තිබෙන බවත් එය වඩාත් යෝග්‍ය බවද ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සංයුතියක් තිබිය යුතු බව ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී කාරක සභාව ලෙස සඳහන් කලේ නම් නිවැරදි බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

අද දින ක්‍රීඩා කමිටු ගරු සභාපතිතුමා ගර මහා සභාවට සහභාගී වී නොමැති බැවින් එතුමා සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගනිමුයැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

මහා සභාවට නොපැමිණෙන්නේ නම් තමාට, ලේකම්තුමාට හෝ අදාල නිලධාරීතුමියටවත් දැනුම් දීමක් කරන ලෙසත්, නැතහොත් නිවාඩු අනුමත කිරීමක් නොකර සිටිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම මහා සභාවේ සිට එය ක්‍රියාත්මක කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 02

ගරු සභාපතිතුමා ඉදිරිපත් කල අදදින මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
- ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
- ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මෙනවිය
- වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

කමිටු සභාපතිවරුන්ටද මෙහිදී කමිටු සඳහා අදාල ගරු මන්ත්‍රීවරුන් ගෙන්වා ගැනීමට වගකීමක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ වන විට රට වේගයෙන් සංවර්ධනය කරා ගෙන යා යුතු ගමනක යෙදෙන බවත්, පක්ෂ විපක්ෂ දෙපාර්ශවයේම කාර්ය භාරයක් බවත් ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරුන්ට වඩා මෙය නිලධාරීන්ට ක්‍රියාත්මක විය යුතු බවත්, කමිටු සඳහා ගරු මන්ත්‍රීවරුන් පැමිණියද නිළධාරීන් නොමැති බවත් පළමුව එය සකස් කරන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ වන විට රජයෙන් ලබා දුන් නිවාඩුද අවසන් බවත්, ලබන සතියේ සිට සුපුරුදු පරිදි කටයුතු කරන බවත්, නිලධාරීන් නොපැමිණෙන්නේ නම් නීතියක් ක්‍රියාත්මක කරන ලෙසට තමන් දැනුම්දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නිලධාරීන් කමිටු මඟ හැර යන බවත්, අදාල නිලධාරීන්ට කමිටු සඳහා අනිවාර්යෙන්ම සහභාගී වන ලෙස පවසන ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් එය ඉතාමත් තදින්ම ක්‍රියාත්මක කරන ලෙසට ලේකම් මහතාට උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 03

2021 ඔක්තෝම්බර් මස පහත සඳහන් **කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2021 ඔක්තෝබර් මස 05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා |
| **3.** | ගරු මන්ත්‍රී යූ.එම්මානුවෙල් මහතා |
| **4.** | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **6.** | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| **7.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2021 ඔක්තෝබර් මස 18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **4.** | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2021 ඔක්තෝබර් මස 01 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |

| | | |
|---|---|---|
| **5.** | ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා | |
| **6.** | ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා | |
| **7.** | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා | |
| **8.** | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා | |

**2021 ඔක්තෝබර් මස 21 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව**

| අ/අ | නම | |
|---|---|---|
| **1.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජේ.විශ්වනාත් මංචනායක මහතා | |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා | |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා | |
| **4.** | ගරු මන්ත්‍රී ආර්.පී. අකිල ශිරංග රාජපක්ෂ මහතා | |
| **5.** | ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය | |
| **6.** | ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා | |
| **7.** | ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා | |
| **8.** | ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා | |

**2021 ඔක්තෝබර් මස 28 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව**

| අ/අ | නම | |
|---|---|---|
| **1** | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා | |
| **2** | ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය | |
| **3** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා | |
| **4** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා | |
| **5** | ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා | |
| **6** | ගරු මන්ත්‍රී වී.කේ .එම්.අසන්ත කුලසේකර මහතා | |

02. පලාත් පාලන ආයතන මඟින් ලබාදෙන සේවාවන් මහජනතාවට වඩාත් සමීප කරලීමේ අරමුණින් වයඹ පළාතේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සේවාලාභීන් සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් හඳුන්වා දෙන මාර්ගගත ක්‍රමයට සේවා ලබා ගැනීම සහ ගාස්තු ගෙවීමේ CAT-2020 online අන්තර්ජාල පහසුකම 2021/10/29 වන දින වයඹ පලාත් ගරු ආණ්ඩුකාර අධිනීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමාගේ සුරතින් ආරම්භ කිරීමට හැකි විය. මුළු ලංකාවෙන්ම මෙය පලමු අවස්ථාව අප උදා කරගත් බවත්, එම අවස්ථාවට සහභාගී වූ ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාටද, ජ්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමාටද, ගරු මන්ත්‍රී මණ්ඩලය ඇතුළු සහභාගී වූ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී. එමෙන්ම මෙම වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහය වූ ලේකම්මහතා ඇතුළු සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.

03. සෞභාග්‍යයේ මංපෙත් වැඩ සටහන යටතේ මාර්ග 90ක පමණ වැඩ අවසන් කර ඇති බව ඉතාමත් සතුටින් දැනුම් දෙන ලදී. සෑම කොට්ඨාසයකම මාර්ගයක් දෙකක් හෝ වැඩ ආරම්භ කර ඇති බවත්, ලබන මාසය වන විට වැඩ කටයුතු අවසන් කිරීමට හැකියාව ලැබෙයැයිද ප්‍රකාශ කරන ලදි.

04. රුපියල් අසූදාහක් පමණ වටිනාකමින් යුත් විශාල කරන ලද මුද්දර, පෝස්ටර්, ග්‍රන්ථ, මුද්දර කවර යනාදිය කියවන මුද්දර සංසදය විසින් 2021-10-14 වන දින කිරිමැටියාන පුස්තකාලය වෙත ලබා දුන් බවත් මෙම සියළුම වැඩ කටයුතු සඳහා සහයෝගය ලබා දෙන ප්‍රජා කමිටු සභාපති ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඇතුළු ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජිකයින් සියළුම දෙනාටද, පුත්තලම් දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන නිලධාරීතුමාටද, ලේකම්මහතා,ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිතුමිය ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලයේ සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.

05. 2022-01-02 වන දින වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ වර්තමාන ලේකම්මහතා විශ්‍රාමගත වීමට නියමිත බැවින් එතුමා සහභාගී වන අවසන් මහා සභාව 2021 දෙසැම්බර් මස 09 වන දින පැවැත්වෙන බැවින් එදින ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් එතුමා සමුගැනීමට අපේක්ෂා කරන බව දැනුම් දෙන ලදී.

06. ප්‍රිමික්ස් අංශය විසින් පසුගිය දිනවල පහත නම් සඳහන් මාර්ග ප්‍රිමික්ස් කල බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට මාගේ ස්තූතිය පුද කරන ලදී.

- දුම්මලකොටුව බයිබල් පල්ලිය පාර
- වෙන්නප්පුව අතුරු මාර්ග
- විජයගම පළමු අතුරු පාර
- කටුකෙන්ද ජනපද මාර්ග
- කුඩවිල පෙරපාසල මාර්ග
- විජයගම දෙවන පටුමඟ ඉතිරි කොටස
- සිරිගම්පල තෙරේසාවත්ත පාර

07. සභාවේ මුදල් හා රජයෙන් ලැබුණ ප්‍රතිපාදන සමඟ ප්‍රාදේශීය සභාවට යම් යම් දේ එකතු කර ගත් බවත්, ඒ පිළිබඳව අප ආඩම්බරයෙන් කතා කල යුතු බවත්, මෝරුක්කුලියේ සුනාමි ගම්මානය ඉදි කර දී තිබූ ඉඩම පෞද්ගලික ආයතනයක් සතුව තිබූ බවත්, ඒ සඳහා ලකෂ 70කට තක්සේරුවක්ද පැමිණි බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. මෙම ධූර කාලය තුළ යම් යම් දේ සභාවට එකතු කර ගත් බවත් ඒ පිළිබඳව සංතෝෂ විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. කිරිමැටියාන ක්‍රීඩා පිටිය, යන්ත්‍ර සූත්‍ර, සතිපොලවල් ගොඩනැඟිලි ආදී සෑම අතින්ම සියළු දේ සිදු කර ගත් බවත් ප්‍රකාශ කරන ලදී. තුලාවල ක්‍රීඩා පිටියේ මුදලද ලබන ජනවාරි මස ගෙවීමට සූදානම් කර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම ඉඩමේ ගොඩනැඟිලි කීපයක්ම තිබෙන බැවින් ස්වයං රැකියා උත්පාදන මධ්‍යස්ථානයක්ද ඇති කල හැකි බවත්, රාජ්‍ය ඇමතිතුමාද අප සමඟ සිටින බවත් එතුමාගේ ලේකම්වරුන්ද අප මන්ත්‍රී මණ්ඩලයේ සිටින බැවින් නිෂ්පාදන ගම්මානයක්ද ඇති කල හැකි බවත් ප්‍රකාශ කරන ලදී. රටට අවශ්‍ය කරනුයේ මුදල් උපයන ක්‍රම බවත්, අතිගරු ජනාධිපතිතුමාට සෞභාග්‍යයේ වැඩ

සටහන ඉදිරියටම ගෙන යාමට දිරියක් විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මාර්තු මාසයේදී මෙය මිලදී ගැනීමට හැකියාව තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය විශාල වටිනාකමක් තිබෙන ස්ථානයක් බව කොට්ඨාසභාර ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය කට්ටිකල ඉඩමක් බවත්, මෙහි පොදු ඉඩම් කොටස වෙන් වී නොමැතිදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

මෙය පෞද්ගලික ඉඩමක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය කට්ටි කැඩූ ඉඩමක්දැයි ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙය කට්ටි කල ඉඩමක් නොවන බවත්, සුනාමිය ඇති වූ හෙයින් එම ජනතාවට මෙම ප්‍රදේශයේ ඉඩමක් ගෙන ලබා දී තිබූ බවත් ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි හිමිකරු කාන්තාවක් බවත්, ගොඩනැඟිල්ලේ භුක්තිය තබාගෙන විවිධ කටයුතු සිදු කල බවත් මේ සම්බන්ධයෙන් තවදුරටත් අධීක්ෂණයක් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

මෙය කට්ටි කර විකුණා තිබේදැයි ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙය බයිබල් ආගමක් මඟින් මිල දී ගෙන මිනිසුන්ට බෙදා දී ඔවුන්ව එම ආගමට බඳවා ගැනීමට උත්සාහ කල බවත්, නමුත් එම මිනිසුන් එම ඉඩම් විකුණා ගිය බවත්, මේ වන විට වෙනත් පිරිසක් සිටින බවත් ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය අධීක්ෂණය කරන ලෙසට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා මාර්තු මාසය වන තෙක් කාලය තිබෙන බවත්, තවදුරටත් සොයා බලා කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය නැවතත් තොරතුරුත් සමඟම ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

08. වෙන්නප්පුව සහකාර පොලිස් අධිකාරී කාර්යාලය තිබෙන කොටස ලබා දීමට නොහැකි බවට පවසා මහා සභාවෙන්ද තීරණය කර ප්‍රාදේශීය ලේකම්තුමියට ලිඛිතව යැවූ බවත්, නැවතත් අප සභාවට ලිපියක් එවා ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා මෙම ලිපිය ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී ඉදිරි කටයුතු සිදු කරනා බවට දන්වා එවා ඇති බවත් නමුත් ගරු මහා සභාව මෙන්ම තමන්ද එයට විරුද්ධ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් විසින් මෙහිදී අදහස් පල කරන ලදී.

කුමන කාලයේදී වෙන්නප්පුව සහකාර පොලිස් අධිකාරී කාර්යාලය මෙම ස්ථානයේ ස්ථාපිත කලේදැයි ගරු සභාපතිතුමා විසින් විමසා සිටින ලදී.

එය 1980 ගණන් වල ස්ථාපිත කල බව ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ දේපල අවශ්‍ය නම් බදු ලබා දිය හැකි බව ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ඉල්ලීමක් කර නොමැති බවත්, මේ සඳහා වහාම කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සියළුම ලිපි ලේඛණ ආපසස්සට සොයා බැලිය යුතු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඔවුන් විසින් මාසික වාරික ගාස්තුවක් ගෙවා තිබේදැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

මින් පෙර ගෙවා ඇති බවත්, නමුත් දැන් නොගෙවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම තොරතුරු ප්‍රමාණවත් බවත්, සභාවට කුලී ගෙවූයේ නම් එය අප සතු දේපලක් බවත් මෙය නිවැරදි කරගත යුතු ගැටළුවක් බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

1987 පිහිටුවන ලද ප්‍රාදේශීය සභාව තුළ සුසාන භූමිද අප සතු බවට පැවසූ බවත්, නමුත් ප්‍රාදේශීය ලේකම් එය ඔවුන්ට අයත් බවට පවසන බවත්,නගර ශාලාව හා දංකොටුව උප කාර්යාලයද අප සතු වුවත් එයද ඔවුන්ට අයත් බවට පවසන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. විෂම අදහස් තිබුණද අප සතු බිම් අඟලක්වත් නොදිය යුතු බවත්, ප්‍රධාන අමාත්‍යවරයාගේ ගැසට් නිවේදනයේද එතුමාගේ අනුමැතියකින් තොරව කිසිදු අයතනයකට පැවරීමට හෝ විකිණීම කල නොහැකි බව සඳහන් වන බවත්, ප්‍රධාන අමාත්‍යවරයා නොමැති නම් ගරු ආණ්ඩුකාරතුමා මගින් එය ක්‍රියාත්මක වන බවත් එතුමාගේ අනුමැතියක් නොමැතිව ලබා දිය නොහැකි බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව දීර්ඝ විශ්ලේශණයක් සිදු කර අවශ්‍ය ලියකියවිලිද සකස් කරගන්නා ලෙසද ප්‍රකාශ කරන ලදී.

ගරු මහා සභාවේ අකමැත්ත ඔවුන්ට යැවීමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ඉතිහාසයේදී ප්‍රාථමික අධිකරණය මෙම ස්ථානයේ තිබූ බවත්, එය අනෙක් පසට ගෙන ගිය බවත් එහි අයිතිය පිලිබඳවද දැනටත් ප්‍රශ්න තිබෙන බවත් එබැවින් මේවා ඉදිරි කාලයේදී නිරවුල් වන තරමට වඩාත් හොඳ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාව සතු ඉඩම් වල පුවරුවක් ප්‍රදර්ශනය කරමුයැයි ගරු මන්ත්‍රී බී. ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් ලිපි ගොණුවක් සකස් කර ආරම්භය කොතැන සිටදැයි සොයා බලන ලෙස ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. ගරු මහා සභාවේ ඒකමතික විරෝධතාවයද ඔවුන්ට යවන ලෙස තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

බදු ලබා දුන් අදාල තොරතුරුද සඳහන් කර ඔවුන්ට එම ලිපිය යවන ලෙස ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 04

වෙන්නප්පුව සහකාර පොලිස් අධිකාරි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල පිහිටි ඉඩම ශ්‍රී ලංකා පොලිසිය වෙත පවරා ගැනීමට අදාලව වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාව විසින් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. මෙහිදී මේ සඳහා දිර්ඝ විශ්ලේෂණයක් කල යුතු බවත් සාකච්ඡා විය. මෙම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික විරෝධතාවය දක්වන ලදී.

09. උපදේශන කාරක සභාව සඳහා නව සාමාජිකයින් පත් කිරිමට අදාල යෝජනාවක් තිබෙන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තීරණ අංක 05

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු මන්ත්‍රීනි එන්.ඒ.තනූජා නිශ්ශංක මහත්මිය, කිරිමැටියාන බෞද්ධ බාලිකාවේ හිටපු විදුහල්පතිනිය වන පතිරාජ මහත්මිය, හෙළබිම පරිසර සංවිධානයේ ගරු උපසභාපති පී. ශිරාන් දබරේරා මහතා සහ හෙළබිම පරිසර සංවිධානයේ ගරු ලේකම් ඩී.පාලිත පෙරේරා මහතා යන අය** උපදේශන කාරක සභාව සඳහා නව සාමාජිකයින් ලෙස පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

10. ඉදි කරමින පවතින විහාරස්ථාන දහම් පාසල් ශාලාවේ වේදිකාව ඉදි කිරීමට දැව සඳහා මොහොට්ටිමුල්ල සුසාන භූමියේ ඇති තේක්ක ගස් කීපයක් ඉල්ලීමට අදාලව තාමරකුලිය, ශ්‍රී ජිනේන්ද්‍රාරාමයේ විහාරාධිපති ස්වාමින්වහන්සේ විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යොමු කරන ලදී.

දැව ප්‍රමාණයට අවශ්‍ය ගස් ප්‍රමාණය බලා එම අවශ්‍යතාවය මත ලබාදෙන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව සහකාර පොලිස් අධිකාරි කාර්යාලය සම්බන්ධයෙන් එවූ ලිපිය මේ මොහොතේ ලැබුණු බවත් එහි ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඉදිරි කටයුතු ද කරගෙන යන බවට පවසන බවත්, ඉඩම් තක්සේරුවෙන් එවූ ලිපිය මෙයට අමුණා නොමැති බවත් එබැවින් එම ලිපියවත් ගෙන්වා ගෙන ඉදිරි කටයුතු කරන ලෙසද ඉල්ලා සිටින ලදී. අප සතු ඉඩමක එලෙස කටයුතු කිරීමට හැකියාවක් තිබේදැයි ගරු මහා සභාවට ගැටළුවක් තිබෙන බවත් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසද පවසා සිටින ලදී.

අප සාකච්ඡා කල ලිපිය අනුව මොහොට්ටිමුල්ල ගස් කීපයක් ලබා දෙමුයැයි ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

හිත් සතුටු කිරීමට ගොස් නැති ප්‍රශ්න යක නොපැටලී සිටිමුයැයිද, තුලාවලද ගැටළුවක් මින් පෙර මතු වූ බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා මෙහිදී පවසා සිටියේ අවශ්‍යතාවය බලා අදාල කටයුතු සිදු කරන ලෙසයි.

නෛතික තත්ත්වයද බලා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

තාක්ෂණ නිලධාරී වාර්තාවක් ගෙන කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සද්භාවයෙන් අවසර ලබා දී ගැටළු ගණනාවක් මින් පෙර මතු වූ බවත්,ගමට වටිනා සම්පතක්ද නොලැබී ගිය බවත් ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

ඩිජිටල් තිරය ඔස්සේ පසුගිය මස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රගතිය සියළුම දෙනාට දැක ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. සේවා ගිවිසුම් කාලය අවසන් වන සේවක මහත්මමහත්මීන් 10 දෙනෙකුගේ සේවා කාලය දීර්ඝ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු මහා සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

තීරණ අංක 06

සේවා ගිවිසුම් කාලය අවසන් වන පහත නම් සඳහන් සේවකමහත්ම මහත්මීන්ගේ සේවා කාලය මාස 06කින් දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

| අ.අ | නම/සේවා ස්ථානය | තනතුර | ගිවිසුම් කාලය දීර්ඝ කර ගැ යුතු කාලය |
|---|---|---|---|
| 01 | ඒ.පී.ඩී. ප්‍රියංකර පෙරේරා මයා<br>වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලය(සෞඛ්‍ය අංශය) | සෞඛ්‍ය කම්කරු | 2021.11.03 දින සිට 2022.05.02 |
| 02 | එම්.පී. අමිල කුමාර මයා<br>ඕතර උතුර උප කාර්යාලය (සෞඛ්‍ය අංශය) | සෞඛ්‍ය කම්කරු | 2021.11.03 දින සිට 2022.05.02 |
| 03 | ටී.බී.ඩී.හසිත කුමාර බාලසූරිය මයා<br>කම්මල්පත්තු උප කාර්යාලය | වැඩ කම්කරු | 2021.11.17 දින සිට2022.05.16 |
| 04 | ඩබ්.ඒ. රොෂාන් ප්‍රියදර්ශන වීරසිංහ මයා<br>ඕතර උතුර උප කාර්යාලය | මුරකරු | 2021.11.29 දින සිට 2022.05.28 |
| 05 | ඩබ්.අමිත් මධුසංඛ පීරිස්<br>ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය | වැඩ කම්කරු | 2021.05.10 දින සිට 2021.12.09 |
| 06 | එස්.එම්.සී.එන්.සිත්මි පෙරේරා<br>දංකොටුව ආයුර්වේද මධ්‍යස්ථානය | ආයුර්වේද සහයක | 2021.07.21 දින සිට 2022.01.21 |
| 07 | ඊ. නිරෝෂණි කංචනා මෙය<br>කිරිමැටියාන මහජන පුස්තකාලය | පුස්තකාල සහයක | 2021.11.27 දින සිට 2022.05.27 |
| 08 | ජී.හිරුණි රංජලා ප්‍රනාන්දු මෙය<br>වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලය (ප්‍රජා අංශය) | පුස්තකාල සහයක | 2021.11.27 දින සිට 2022.05.27 |

| | | | |
|---|---|---|---|
| 09 | එම්. ශාමල් අකලංක ප්‍රනාන්දු මයා<br>දංකොටුව මහජන පුස්තකාලය | පුස්තකාල සහයක | 2021.11.27 දින සිට<br>2022.05.27 |
| 10 | ආර්.ඉෂානි ශශිකලා ප්‍රනාන්දු මෙය<br>වෙන්නප්පුව මහජන පුස්තකාලය | පුස්තකාල සහයක | 2021.11.27 දින සිට<br>2022.05.27 |

ii. කොරෝනා වසංගත තත්ත්වය හමුුවේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් වල වාර්ෂික ක්‍රීඩා උත්සවය මෙවර නොපැවැත්වෙන අතර වර්ෂ අවසානයේ පැවැත්වීමට නියමිත පෙර පාසල් විවිධ ප්‍රසංගය හා නිර්මාණ ප්‍රදර්ශනය ද ඉතා සරලව පෙර පාසල් මට්ටමින් පැවැත්වීමටත්, එහිදී ක්‍රීඩා උත්සවය නොපැවැත්වෙන බැවින් ඒ සඳහා වෙන්කර ඇති සභා ප්‍රතිපාදන වලින් දරුවන් සඳහා පාවහන් යුගලයක් හෝ පාසල් බෑගයක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

මෙහිදී සපත්තු ලබාදෙන්නේ නම් වඩාත් සුදුසු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සපත්තු මිලදී ගැනීම පහසුදැයිද දරුවන්ගේ කකුල් වල ප්‍රමාණ වෙනස් වන බවත් ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී.

මීන් පෙරද ක්‍රියාත්මක වූ පරිදි සභාව මඟින් යම් අවසර පත්‍රයක් ලබා දී වෙළඳසැලට ගොස් අවශ්‍ය ප්‍රමාණයට ලබා ගැනීමට හැකි බව ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එය ගැටළුවක් නොව බවට ගරු සභාපතිතුමා ද ප්‍රකාශ කරන ලදී.

අවශ්‍යතාවය මත වර්ග දෙකෙන්ම ලබා දෙමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එක් දරුවෙකු සඳහා එක් මිල ගණනක් වෙන් කරන්නේදැයිද පාවහන් වල සහ පාසල් බෑගයේ මිල ගණන් සමාන නොවන බවද ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී පාවහන් පමණක් ලබා දීමට ගරු මහා සභාව අවසානයේදී තීරණය කරන ලදී.

| |
|---|
| තීරණ අංක 07<br><br>**ප්‍රාදේශීය සභා පෙර පාසල් සඳහා** වර්ෂ අවසානයේ පැවැත්වීමට නියමිත පෙර පාසල් විවිධ ප්‍රසංගය හා නිර්මාණ ප්‍රදර්ශනයද ඉතා සරලව පෙර පාසල් මට්ටමින් පැවැත්වීමටත් එහිදී ක්‍රීඩා උත්සවය නොපැවැත්වෙන බැවින් ඒ සඳහා වෙන් කර ඇති සභා ප්‍රතිපාදන වලින් (රු. 1,000,000.00) දරුවන් සඳහා පාසල් පාවහන් යුගලයක් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් **ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව** මේ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iii. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් මෝරුක්කුලිය නාමල් උයන (සුනාමි ගම්මානය) ප්‍රජා ශාලා ගොඩනැඟිල්ල පිහිටි ඉඩම තක්සේරු කර 2021-11-03 වන දින ලිපියක් එවා ඇති බවත් එ තක්සේරු මිල යටතේ එය මිලදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

මින් පෙරද සාකච්ඡා කල පරිදි මේ සඳහා අවසරයක් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා ගරු මහා සභාවට දැනුම් දෙන ලදී.

අදාල තොරතුරු සමඟ මෙය ඊළඟ මහා සභාවට යොමු කරන ලෙස ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

## b.ගරු මන්ත්‍රී යෝජනා

i..මැද දුම්මලදෙණිය ඩිපෝව මාර්ගය ඩිපෝ වැට දෙසින් පුළුල් කිරීම සඳහා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙම මාර්ගයේ ඉදිරිපස කොටස ඉතාමත් පටු බවත්, වාහන දෙකක් මාරු වීමටද ඉතාමත් අපහසු බවත් ප්‍රකාශ කරන ලදී. මෙය දීර්ඝ කාලයක් මුළුල්ලේ ඩිපෝවෙන් ඉල්ලුවද නිසි පිළිතුරක් නොලැබුණු බවද ප්‍රකාශ කරන ලදී. තමන් සති දෙකකට පමණ ඉහතදී ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මැතිතුමාව හමු වූ බවත්, එතුමා එහිදී අදාල ක්‍රමවේදයට අනුව කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. එම ක්‍රමවේදය නම් මෙම මාර්ගය සභාව මඟින් මැන අවශ්‍යා ප්‍රමාණය වෙන් කර අදාල යෝජනාව සභා සම්මත කර එතුමාට එවන ලෙසත් ගැසට් නිවේදනයට ඇතුළත් කරන ලෙසට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. අදාල කටයුත්ත ඉෂ්ට කර දෙන මෙන්ද ඉල්ලා සිටින ලදී. මෙම මාර්ගය කාපට් කිරීමටද නියමිත බැවින් මෙයට ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙසටද ඉල්ලා සිටින ලදී. ආරම්භයේ අඩි 03ක්ද , මැද කොටසින් අඩි 02ක්ද අවසාන කොටසින් 01 ලෙස මැන මෙම කටයුත්ත අවසන් කරදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

එය මැනීමට කාගෙන් අවසර ගතයුතුදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

මාර්ගය සභාවට අයත් බවත්, අවසර ගැනීමට අවශ්‍යා නොවන බවත් ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 08

දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙම මාර්ගයේ ඉදිරිපස කොටස ඉතාමත් පටු බවත්, මෙම මාර්ගය කාපට් කිරීමටද නියමිත බැවින් ඊට ප්‍රථම මේ සඳහා විශේෂ අවධානය යොමු කර මෙම මාර්ගය සභාව මඟින් මැන, ගැසට් නිවේදනයට ඇතුළත් කර අදාල ඉදිරි කටයුතු සිදු කරන ලෙසට ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රීනි ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ii. නැ/ බොරලැස්ස - කේ.සිරිල් මහතාගේ නිවස දක්වා දිවෙන මාර්ගය තාර යොදා පිළිසකර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

මේ වන විට සංවර්ධන යෝජනා කීපයක්ම සිදු කර අවසන් බැවින් තම කොට්ඨාසය සඳහා වෙන් කල මුදලින් ඉතිරි වී ඇති මුදලින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ඉල්ලා සිටින ලදී.

තීරණ අංක 09

බොරලැස්ස කොට්ඨාසයේ 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති ඉතිරි යෝජනා වෙනුවට නැ/බොරලැස්ස කේ.සිරිල් මහතාගේ නිවස දක්වා දිවෙන මාර්ගය තාර යොදා පිළිසකර කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනි ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

i. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ශෝක පණිඩියක් සභාගත කිරීමට අවස්ථාව ඉල්ලා සිටින ලදී.අද වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ ආදරණීය පියාණන් අභාවප්‍රාප්ත වී වසර 27ක් ඊයේ දිනට ගෙවුන බවත්, එතුමා පුත්තලම දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙසත්, වයඹ පලාත් සභාවේ ගරු ධීවර, සමූපාකාර, පේෂකර්ම හා සංචාරක අමාත්‍යවරයා ලෙසත්, විශේෂයෙන්ම වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ 1977න් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැඟීමට පුරෝගාමී වූ දේශපාලන නායකයෙකු ලෙසත්,වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයට විශාල සේවයක් කල පුරවැසියෙකු ලෙසත් එතුමාව හඳුන්වා දිය හැකි බව සිහිපත් කරන ලදී.1994 නොවැම්බර් මස 10 වන දින මෙරට පැවැත්වූ ජනාධිපතිවරණ මැතිවරණයේදී මැතිවරණ ගණන් කර ආපසු එව ගමනේදී එතුමා නොසිතූ ලෙස රිය අනතුරකට භාජනය වෙමින් මිය පරලොව යාමට යෙදුන බවත් ප්‍රකාශ කරන ලදී. එතුමා වෘත්තීයෙන් නීතිඥයෙකුද, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නීතිඥ සංගමයේ ගරු උපසභාපතිතුමා ලෙසත්, පුත්තලම දිස්ත්‍රික්කයේ ලංකා නිදහස් පක්ෂ නීතිඥ සංගමයේ ගරු සබාපතිතුමා ලෙසත් ශ්‍රී ලංකා බුද්ධිමතුන්ගේ සංගමයේ ගරු උපසභාපතිතුමා ලෙසත් කටයුතු කල බවත්එම කාල පරාසය තුළ විශේෂයෙන්ම වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයට දේශපාලන මතිමතාන්තර කොතෙක් තිබුණද එතුමා වෘත්තීය මට්ටමින් රැඳී විශාල සේවයක් සපයා දීමට කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී. 1991දී ප්‍රාදේශීය සභා මැතිවරණය පැවත්වීමට කටයුතු යෙදුන විට එතුමා ආසනයේ සංවිධායකයා ලෙස කටයුතු

කරමින් එවකට මෙම සභාව තමන් ඇතුළු විපක්ෂයේ සාමාජිකයින් 07 දෙනෙකු නියෝජනය කිරීමට අවස්ථාව ලැබුණේද එතුමාගේ සංවිධානය තුල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඊයේ දිනට එතුමා මිය පරලොව ගොස් වසර 27ක් ගෙවුන බවත්, අද වන විට එතුමාගේ පුතණුවන් මෙම සභාව නියෝජනය කරන බවත්,එතුමාට අද දින ගරු මහා සභාවට සහභාගී වීමට නොහැකි වුවද තම යුතුකමක් හා වගකීමක් ලෙසත්,තම බිරිඳගේ ඥාති සම්බන්ධයක්ද එතුමා සමඟ ඇති බවත් එමෙන්ම ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා අප සභාව නියෝජනය කරන බැවින්ද ශෝක පණිඩිඩය එතුමා වෙත යවන ලෙසටද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කරන ලදී. අද වන විට මෙම වෙන්න්ප්පුව ප්‍රාදේශීය සභාව තුළ ගරු සභාපතිතුමා අසුන් ගෙන සිටින්නේද අප පක්ෂය මෙලෙස තිබෙනුයේද මේ සියල්ලම එතුමාගේ දායකත්වය තුල ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී. මේ සියල්ලම ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඉතාමත් ආඩම්බරයෙන් හා ගෞරවයෙන් යුතුව සිහිපත් කරන ලදී. වාමාංශික බලමුලු තුල ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු චරිතය සුවිශේෂී චරිතයක් වූ බවත්, අද එතුමාගේ ආදරණීය දරුවන් සමාජ මෙහෙවර තුළ විශාල වැඩ කොටසක් හා වගකීම් දරණ පුරවැසියන් ලෙස කටයුතු කරන බවත් එතුමාගේ ඥාති පුත්‍රයා අද වෙන්නප්පුව බල ප්‍රදේශයේ පුත්තලම දිස්ත්‍රික්කයේ වැවිලි කර්මාන්ත ගරු රාජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කරනා පරිසරයත් එතුමා ගොඩනැඟුනේද ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු නාමය තුල යැයිද ඉතාමත් ගෞරවාන්විතව සඳහන් කරන ලදී.

වසර 53ක් ආයු වළඳා 1994 නොවැම්බර් 10 වන දින වෙන්නප්පුව මැතිවරණ බල ප්‍රදේශයේ දුම්මලදෙණිය ග්‍රාමය තුලම එතුමා මියපරලොව යාමට සිදු වූ බවත් එම කටයුත්ත කෙලෙස සිදු වුවද එතුමාගේ සේවය ඉතාමත් අගය කරන බවත්, එතුමාගේ නාමයට මොක්සුව ප්‍රාර්ථනා කරමින්ද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා තම කතාව අවසන් කරන ලදී.

ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳව සිටි ලේකම්වරයා ලෙස මෙම යෝජනාව තමන් ස්ථිර කරන බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ස්ථිර කරන ලදී.

| තීරණ අංක |
| --- |
| වසර 27 ගෙවීම නිමිත්තෙන් 1994 නොවැම්බර් 10 වන දින අප අතරින් වෙන් වූ ගරු ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පල කිරීමේ යෝජනාව එතුමාගේ ආදරණීය පුත්‍රයාණන් වන ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන මහතාට ලිඛිතව යැවීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ස්ථිර කරන ලදී. |

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ආණ්ඩු පක්ෂ සංවිධායක ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඉදිරිපත් කල ශෝක පණිඩිඩයටවිශේෂයෙන්ම ජේෂ්ඨ නීතිඥවරයෙකු ලෙස දිවන්ගත ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමා කල සේවය අගය කිරීම සඳහාතවත් අදහස් එකතු කිරීමට අවස්ථාව ඉල්ලා සිටින ලදී. එවකට තිබූ භීෂණකාරී සමයේදී එයට විරුද්ධව ප්‍රගතිශීලී ජනතාව වෙන්වෙන් එකතු වී එතුමා විශාල හඩක් නැඟූ බවත් මාරවිල, හලාවත, පුත්තලම,හෙට්ටිපොල,කුරුණෑගල හා අළුත්කඩේ යන අධිකරණ වල එතුමා මේ වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී. මානව හිමිකම් උල්ලංඝණය වූ අවස්ථාවලදී එතුමා සුවිශාල කාර්යභාරයක් එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වය දෙමින් සිදු කල බවත්, එතුමා පුත්තලම් දිස්ත්‍රික්කයට වෙන්නප්පුව ආසනයට විශාල ශක්තියක් ලබා දෙමින් කල සේවය සිහි කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණියගේ ප්‍රජා අයිතිය අහෝසි කල අවස්ථාවේදී එතුමියගේ ප්‍රජා අයිතිය නැවත ලබා ගැනීමට වෙහෙස වූ නීතිඥ

කණ්ඩායමේ ප්‍රධාන සාමාජිකයෙකුද ලෙස එතුමා කටයුතු කල බවත්, වෙන්නප්පුව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරීත්වය බිංදුවටම බැස තිබූ අවස්ථාවේදී එතුමා ගමක් ගමක් ගානේ ගොස් ජනතාවගේ දුක සැප බලා ඒවාද අඳුනා ගනිමින් ගම් මට්ටමින් ප්‍රගතිශීලි කණ්ඩායම එකතු කර ගෙන සුවිශාල මෙහෙවරක් සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී. තමන් නීති විද්‍යාලයේ අධ්‍යාපනය හදාරණ කාලයේ එනම් 1994 නොවැම්බර් මස 10 වන දින අවාසනාවන්ත ලෙස එතුමා මියපරලොව යාමට යෙදුන බවත් ප්‍රකාශ කරන ලදී. තම පියාණන්ගේද දේශපාලන කටයුතු වලදී ද එතුමා විශාල සහයෝගයක් ලබා දුන් බවත්, වසර 17ත් තිබූ සමය පෙරළා නව ප්‍රගතිශීලි සමයක් ආරම්භ කිරීමට එතුමා ජීවිතයද පරදුවට තබා කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී. එතුමාගේ දරුවන් අතරින් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා අප සභාවට දායාද කල බවත්, මැතිණිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් දක්වා ගෙන ගිය බවත් එතුමාගේ නාමය අමරණීය බවත් ප්‍රකාශ කරමින් තම කතාව අවසන් කරන ලදී.

ii. ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මියගේ කොට්ඨාසයේ ජලයෙන් යට වී ඇති කොටසට කාණු කැට කීපයක්ම දමා මැන්හෝල් එකක් යොදා ජලය ඉක්මනින් බැස්සවිය යුතු බවත්, ඒ සඳහා රු.160,000.00ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් එය ඊළඟ කර්මාන්ත කමිටුව වෙත යොමු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව එය හිටපු ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රුක්මන් කොළඹගේ මහතා ජීවත් වන ප්‍රදේශය බවත්, වසර ගණනාවක සිට එම ප්‍රදේශය ජලයෙන් යට වන බවත් ප්‍රකාශ කරන ලදී. මෙය විශාල ගැටළුවක් බවත්,හියුම් පයිප්ප යොදා එය ක්‍රියාත්මක කලද ජලය බැස යන මාර්ගයේ අපහැදිලිතාවයක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.ඩයස්වත්තේ මෙතෙක් ජලය විශාල ප්‍රමාණයක් රැඳී තිබූ බවත්, කාණුව පිළිසකර කිරීමට භූමියක් ලබාදෙන බව පවසා එම ඉඩම ගොඩ කල බවත්, අවසානයේ කාණුව කැපීමට අඩි 04ක පමණ භූමි ප්‍රමාණයක් තිබෙන බවත් එම ප්‍රමාණය එම ආකාරයෙන්ම තබා ඉදිකිරීම් කටයුතු කලයුතු බවත් මන්ද ලබන වසරේද මෙලෙස වර්ෂාවට ජලය රැඳෙන්නේදැයි නිරීක්ෂණය කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එම ස්ථානය සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කර මෙම වැඩ කටයුතු සිදු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මියට උපදෙස් ලබා දෙන ලදී.

හියුම් පයිප්ප දමා ජලය බැස්සවුවද යම් කිසි ලෙස නැවතත් ලබන වසරේ ජලය රැස් වුවහොත් නැවත මෙම ගැටළුව පැන නගින බැවින් මෙම කටයුත්ත ක්‍රියාත්මක වුවද අදාල කටයුතු සිදු කර අවසන් කිරීමට ඉඩම් හිමියාට අවසර ලබා නොදෙන ලෙසටත්, අදාල ඉඩම් ප්‍රමාණය තබා මෙම කටයුතු සිදු කරන ලෙසටද ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ඉල්ලා සිටින ලදී.

තීරණ අංක 16

කඩිනමින් වැඩ අවසන් කල යුතු බැවින් කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන තෙක් බොරලැස්ස තිසරු හෝටලය අසල හියුම් පයිප්ප කාණුවට මැන්හෝල් ඉදිකිරීම සඳහා සකස් කර ඇති රු.160,000.00ක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති මහත්මිය ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 2022 අයවැය යෝජනා යටතේ පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරන බවත්, තම වසමට මාර්ග විශාල ප්‍රමාණයක් තිබෙන බවත්, එබැවින් තමන්ට හැම පසින්ම අසාධාරණයක්ද සිදු වී ඇති බවත්,මාර්ග විශාල ප්‍රමාණයක් සෑදීමටද තිබෙන බවත් එබැවින් එය සලකා බලා ඒ සඳහා කුමන හෝ විසඳුමක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා සමඟද සාකච්ඡා කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය ඉල්ලීම් කල මාර්ග දෙකක් සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහනින් ඉදි කිරීමට අනුමැතිය ලැබී ඇති බවද ප්‍රකාශ කරන ලදී.

iv. ලුණුවිල බුළුගහ අසල සිට වෙල් යාය අවසන් වන තෙක් මාර්ගය අඩි දෙකක් පමණ උස් කර ගැනිමට අදාලව ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.මෙය තමන්ම මෙන්ම අනෙක් ගරු මන්ත්‍රීවරියට සහ ගරු මන්ත්‍රීතුමාටද බලපාන ගැටළුවක් බවත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක

**ඉතාමත් කුඩා ගංවතුර අවස්ථාවකදී වුවද ලුණුවිල බුළුගහ අසල සිට වෙල් යාය මැදින් ජනපදයට දිවෙන මාර්ගය වතුරින් යට වන බවත්, මෙහිදි ජනතාව ඉතාමත් අපහසුතාවයට පත් වන බවත් සාකච්ඡා විය. එම සාකච්ඡාව අනුව එම මාර්ගය අඩි දෙකක් පමණ උස් කර දෙන ලෙසද, රේල්පාර අසල බෝක්කුව නවීකරණය කර දෙන ලෙසටද පලාත් මහාමාර්ග අමාත්‍යාංශයට ලිපියක් යැවීම සුදුසු බවටත් එම ලිපියේ පිටපතක් පොල්,කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා වන ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාට ද යැවීම සුදුසු බවටත්** ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

v. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභා වාර්තාවේ 10 වන පිටුවේ නිකවැරටිය ගරු සභාපතිතුමා සම්බන්ධයෙන් වූ යෝජනාව කල් තබන ලදී ලෙස සඳහන් වන බවත් එහි ඉදිරි කටයුතු පිළිබඳව විමසා සිටින ලදී.
මෙහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ පවතින ගැටළු නිරාකරණය කරගන්නා තෙක් මෙය පසුවට කල් තැබූ බවයි.

vi. ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමනේ පසුව 2022 අයවැයෙන් තුලාවල කොට්ඨාසයේ අක්කර 03 ½ ක්‍රීඩාංගණක් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් කොට්ඨාසයේ මන්ත්‍රීවරුන් සියළුම දෙනා සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී. 2018 සිටම තමන් තුලාවල කොට්ඨාසයේ තිබෙන අඩුපාඩු පිළිබඳව කතා කරන බවත්, ග්‍රාම නිලධාරීටවත් සිටීමට ස්ථානයක් නොමැති බවත් හිටපු ගරු මන්ත්‍රිනී තනූජා නිශ්ශංක මහත්මියද තුලාවලට වැඩ කොටසක් කල බවත් නමුත් මෙම අක්කර 03 ½ ලබා ගැනීම තම සිහිනයක් සැබෑ වීමක් බවත් ප්‍රකාශ කරන ලදී. අද මෙයට රුපියල් කෝටියක් වියදම් කලද දශක දෙක තුනක් ගත වන විට ඉතාමත් ඉහළ වටිනාකමක් ලැබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. යම් විට තමන්

ආවේගශීලිව සභාව තුල කතා කර තිබූ බවත්, තමන් විපක්ෂයේ කාර්යභාරය කරනවායැයි පක්ෂයේ මන්ත්‍රීවරුන්ද පැවසූ නමුත් මේවා ලබා ගැනීම පිණිස තමන් කතා කල බව ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා පසුගිය දිනවල සේවක කණ්ඩායම් සහ මැෂින්ද ලබා දුන් බවත්, ධූර කාලයද අවසන් වීගෙන යන බැවින් හිත් රිදීම් ඇති ර නොගත යුතු බවත් කිසිවෙකු සමග අමනාපයක් නොමැති බවත් මේ අවස්ථාවේදී තමන්ට ඉතාමත් සතුටක් දැනෙන බවත් ප්‍රකාශ කරන ලදී. තම දේශපාලන කාලය තුල මේ දෙය කර ගැනීම ප්‍රමාණවත් බවත්, තුලාවලට කුඩම්මාගේ සැලකිලි ලැබී ඇති බවත්, ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියගේ සැමියාද එතුමා සභාව නියෝජනය කල කෙටි කාලයේදී වැඩකොටසක් කල බවත් එමෙන්ම තනූජා නිශ්ශංක මහත්මියද යම් වැඩ කොටසක් සිදු කල බවත් මේවන විට තමන් කොට්ඨාස භාර ගරු මන්ත්‍රීවරයා ලෙස සිටින මෙහොතේ මේ ඉල්ලීම් දිනා ගැනීම පිණිස තමන් කටයුතු කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ප්‍රාදේශීය සභාවට අයත් සියළුම මාර්ග සුද්ද කල බවත්, පලාත් සභා මාර්ග කැලෑ වී ඇති බවත් ඒවාද සුද්ද කරගන්නා ලෙසට ඔවුන් පවසන බවත් ප්‍රකාශ කරන ලදී.

පලාත් සභාව ක්‍රියාත්මක වන තෙක් එම මාර්ගද සභාව මඟින් සුද්ද කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.